**පුත්තලම මහා නගර සභාව - 2023**

**---------------------------------------**

පුත්තලම මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු පිළිබඳ විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සෑම විගණනය කරනු ලබන ආස්ථිතයක් විසින් ම එම ආස්ථිතය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම ආස්ථිත්‍ය වල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්ථා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3 පුත්තලම මහා නගර සභාව සංස්ථාපනය කිරීම හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

2022 සැප්තැම්බර් 06 දිනැති අංක 2296/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළාත් පාලන හා පළාත් සභා විෂයභාර අමාත්‍යවරයා විසින් 2023 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුත්තලම නගර සභාව විසුරුවා හැර 2023 මාර්තු 20 දින සිට පුත්තලම මහා නගර සභාව සංස්ථාපනය කර එම දිනය සභිකයින්ගේ ධූර කාලය ක්‍රියාත්මක වන දිනය ලෙස දක්වා තිබුණි. එහෙත් මහා නගර සභා ආඥා පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව නියමිත සභික සංඛ්‍යාව තෝරා පත් කරගෙන නොමැති වුවද සභාව ඒ දිනයේදී සංස්ථාපනය කරනු ලැබූ සේ සැලකිය යුතුය. එසේ වුවද මහා නගර සභා ආඥා පනතේ 170 (1) වගන්තිය පරිදි නාගරික කොමසාරිස්වරයෙකු පත් කිරීමද සිදු නොකර තවදුරටත් පුත්තලම නගර සභාව නමින්ම පරිපාලන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.තව ද මහා නගර සභාව විසින් 2023 මාර්තු 19 දිනට ඉදිරිපත් කළ යුතු ඇවර කිරීමේ ගිණුමක් ද 2023 මාර්තු 20 දින සිට 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන ද පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම.** | **ලේකම්ගේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| | <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ 104 (1) | 2021 ජනවාරි 01 දින අනතුරට ලක් වී තිබූ කැබ් රථයට සිදු වූ අලාභ හානිය ගැන පරීක්ෂා කිරීම හා ඊට වගකීම නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ පරිදි කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කළමනාකරණ අකාරයක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 මාර්තු 20 දින සිට පුත්තලම මහ නගර සභාව නෛතිකව සංස්ථාපනය වී තිබුණත් ඒ සඳහා නාගරික කොමසාරිස්වරයකු පත් කර නොතිබුණි. | පුත්තලම මහා නගර සභාව නෛතිකව සංස්ථාපනය වී ඇතත් මෙතෙක් අනෙකුත් මානව හා ක සම්පත් අවශ්‍යතා සම්පූර්ණ වී නොමැති වීම තුළ මහ නගර සභාවක් ලෙස ක්‍රියාත්මක නොවන බව | මහා නගර සභාවක් ලෙස නෛතිකව සංස්ථාපනය වී ඇති බැවින් නොපමාව මහා නගර සභාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. |
| (ආ) | කඩ කාමර 176ක වෙළඳ සංකීර්ණයක් දින 540කින් සහ රු.337,750,000 වටිනාකමකට ඉදිකර ගැනීමට 2015 ජුනි 10 දින ගිවිසුම් ගත වී පසුව 2017 අගෝස්තු 03 දින නැවතත් ගිවිසුම් ගත වී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි 2019 ඔක්තොබර් 10 දින සිට ඉදිරි දින 540කින් සහ රු.437,500,000 වටිනාකමට කොන්ත්‍රාත් ගිවිසුම නැවත සංශෝධනය කර තිබුණි. වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට අවශ්‍ය මුදල් සපයා ගැනීම යෝජිත කඩ කාමර මිලදීගන්නන්ගෙන් පෙර මුදල් අයකර ගැනීම මඟින් සපයා ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් 2023 නොවැම්බර් වන විට ගැනුම්කරුවන් 155 දෙනෙකුගෙන් සම්පූර්ණ පෙර මුදල ම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර අදාළ මුදල අයකරගෙන තිබුණේ ගැණුම්කරුවන් 21කින් පමණක් විය.ඉදිකිරීම් සඳහා උපදේශක සේවා ලබාගෙන තිබුණු අතර ඒ සඳහා ගෙවා තිබුණු මුදල රු.22,463,610ක් වුවත් වසර 6ක පමණ කාලයක් තිස්සේ ඉදිකිරීම් නිමකර ගැනීමට නොහැකි වී තිබුණු අතර ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 60ක පමණ මට්ටමක විය. එතෙක් ඉදිකිරීම් වෙනුවෙන් දරා තිබුණු මුදල රු.512,805,987ක් වූ අතර කොන්ත්‍රාත්කරුට නියමිත පරිදි බිල්පත් ගෙවීම ප්‍රමාද වීම නිසා රු.3,558,259ක ප්‍රමාද පොළියක් ගෙවීමට ද සිදු වී තිබුණි. | මේ වන විට ගරු මහ සභාව විසුරුවා හැර ඇති බැවින් සභාව විසින් අවසන් වරට ගනු ලැබූ තීරණය මත පදනම්ව මුළු පෙර මුදල් වටිනාකමින් 1/3 කට අඩුවෙන් ගෙවා ඇති කඩ කාමර සමඟ පවතින අවබෝධතා ගිවිසුම අවලංගු කර නැවත ටෙන්ඩර් කැඳවීම සිදුකර ඇති බව දන්වා ඇත . | කඩිනමින් වෙළඳ සංකීර්ණය ඉදිකර ප්‍රතිලාභ මහජනතාවට ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කඩ කාමර 74ක වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම 2022 දෙසැම්බර් 19 දින ආරම්භ කර තිබුණු අතර ඊට අවශ්‍ය අරමුදල් කඩ කාමර 29ක් ටෙන්ඩර් කර තෝරා ගන්නා | ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් කටයුතු පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව ටෙන්ඩර් ලබාදීමෙන් | කඩිනමින් වෙළඳ සංකීර්ණය ඉදිකර ප්‍රතිලාභ මහජනතාවට |

| | | |
|---|---|---|
| ගැනුම්කරුවන්ගෙන් අයකරන පෙර මුදල් මඟින් හා පැරණි වෙළඳ සංකීර්ණය ඉවත් කිරීමේ දී කඩ අහිමි වූ 45 දෙනෙකුට අලුතින් ලබාදෙන කඩයකින් අයකරන රු.1,800,000 බැගින් වූ අයකර ගැනීමට අපේක්ෂිත වූ මුළු මුදල රු.195,220,644ක් විය. ටෙන්ඩර් කල කඩ කාමර 29න් 25ක් පමණක් විකුණා තිබුණු අතර කඩ අහිමි වූ අයට අලෙවි කිරීමට තිබුණු කඩ 45න් අලෙවි කර තිබුණේ 4ක් පමණක් විය. 2023 නොවැම්බර් වනවිට අය කරගෙන තිබුණු මුළු විකුණුම් වටිනාකම රු.42,915,000ක් පමණක් වුයෙන් තවදුරටත් රු.152,305,644ක විකුණුම් සිදුකර ගැනීමට ඉතිරිව තිබුණි.පෙර මුදල් අයකර ගැනීම දූර්වල මට්ටමක පැවතීමත් සැලසුම් කළ පරිදි කඩ කාමර අලෙවි කර ගැනීමට අපොහොසත් වීමත් හේතුවෙන් වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු දිගින් දිගට ම ප්‍රමාද වෙමින් තිබුණු අතර 2023 නොවැම්බර් වනවිට ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 11වැනි පහළ අගයක පැවතුණි. | ඉටුකරවා ගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී. | ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුත්තලම නගර සභාවට අයත් මාළු වෙළඳසැල් බදු දී පසුකාලීනව ඒවායෙහි ස්ථාන මාරු කර තිබූ අතර එහි වෙළඳසැල් 36ක් සඳහා රු.900 බැගින් කුලියක් අයකර තිබූ අතර කවර දිනක සිට එය අයකළා ද යන්නට තොරතුරු නොතිබුණි. එම වෙළඳසැල් සඳහා ගිවිසුමකට එළඹීමකින් තොරව වෙළඳාම් කර ගැනීමට අවස්ථාව සලසා දී තිබුණු අතර අධිශීතකරණ සහිතව පවත්වාගෙන ගිය එම වෙළඳසැල්හි මාසික විදුලිබිල් සභාව විසින් ගෙවා තිබුණි. පරීක්ෂාවට ලක් කළ 2023 පෙබරවාරි සිට ඔක්තොම්බර් දක්වා මාස 9ක කාලය වෙනුවෙන් ගෙවන ලද විදුලිබිල්වල වටිනාකම රු.1,381,054ක් වූ අතර මෙම කාලයට වෙළඳසැල් 36න් අයකරගෙන තිබුණු කුලි ආදායම රු.291,600ක් පමණක් විය.අයකරගත් කුලි ආදායම ඉක්මවා මාළු වෙළඳසැල්වල විදුලි වියදම සඳහා සභාව විසින් රු.1,089,454ක් ගෙවා තිබුණි. | තාවකාලික කඩ සඳහා ලිපිගොනු යාවත්කාලීන කිරීමටත් ගිවිසුම් සකස් කිරීමටත් අදාල කටයුතු සූදානම් කරමින් සිටින බව | ටෙන්ඩර් කර විධිමත් ගිවිසුම්වලට එළඹ කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | වර්ෂ 5කට වරක් වරිපනම් බදු ප්‍රතිශෝධනයන් සිදු කළ යුතු වුවත් නගර සභා බල ප්‍රදේශය තුළ | ගොඩනැගිලි තක්සේරු කිරීමේ කටයුතු සඳහා තක්සේරු | කාලීනව ගැලපෙන පරිදි වරිපනම් බදු |

| | | |
|---|---|---|
| 2015 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව මතම වරිපනම් බදු අයකරමින් තිබුණි | දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සිදු කරන බව දන්වා ඇත. | ප්‍රතිශෝධනයන් කර ගාස්තු අය කළ යුතුය. |
| (ඈ) විශ්‍රාම ගිය සේවකයින් 95 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.179,694ක ණය ශේෂ පැවතුණි. | එම ණය ශේෂ කපා හැරීමට අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යවා ඇති බව. | අය විය යුතු සේවක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතු ගොඩනැගිලි සහිත ඉඩම් , සභාව විසින් භුක්ති විඳින, පාලනය හා නඩත්තු කෙරෙන ක්‍රීඩාපිටි, ප්‍රජා ශාලා, සතිපොළ, පුස්තකාල, ළමා උද්‍යාන, සායන මධ්‍යස්ථාන වැනි වත්කම් 50ක නිත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | පුත්තලම නගර සභාව විසින් භුක්ති විඳිනු ලබන රජය සතු සියලු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සඳහා ඉල්ලීම් කොට ඇති බව. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) භාණ්ඩ සමීක්ෂණයෙ දී අනාවරණය වී තිබුණු භාණ්ඩ 157ක ඌනතාවය සම්බන්ධයෙන් 2023 නොවැම්බර් 24 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඌනතා පැවතියහොත් අධිභාර කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩ ඌනතාවයන් හඳුනා ගෙන අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ ද්විතියික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 33ක් හා ප්‍රාථමික ශ්‍රේණි තනතුරුවල පුරප්පාඩු 50ක් පැවතුණි. | පුරප්පාඩු පැවති නිසා නගර සභාවේ වැඩ කටයුතු අනියම් කම්කරුවන් යොදවාගෙන සිදු කරනු ලබන බව. | කාර්ය මණ්ඩල අවශ්‍යතා කාලීනව සමාලෝචනය කර ගත යුතුය. |

**3. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**3.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා මු.රෙ.133(1) අනුව අභ්‍යන්තර විගණනය, ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් වැඩි අවධානයනින් කටයුතු කිරීමට උත්සාහ දරන බව. | ආයතනයේ සියලුම කටයුතු ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. |

විය යුතුබව දැක්වෙතත් සභාවේ අභ්‍යන්තර විගණනය විසින් දේපළ බදු දීම සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය පරීක්ෂාව, සරප් මුදල් ලැබීම්, ගෙවීම් හා බැංකුගත කිරීම වැනි පරීක්ෂා පමණක් සිදු කර 2023 වර්ෂයට විගණන විමසුම් 02ක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

## 3.2 තිරසර සංවර්ධන අරමුණු

| **විගණන නිරීක්ෂණය** | **ලේකම්ගේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සඳහා ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක වෙනුවෙන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට තිරසර සංවර්ධන අරමුණු 06ක් සඳහා ඉලක්කයන් හඳුනාගෙන තිබුණු නමුත් ඉන් එක් අරමුණක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු 06 ක් හඳුනාගෙන තිබූ නමුත් රටේ පැවති අසාමාන්‍ය තත්වය හා කෝරෝනා වසංගතය හේතුවෙන් හඳුනාගෙන තිබූ අරමුණු 06 න් එක් අරමුණක් පමණක් ඉටු කර ගැනීමට හැකි වූ බව. | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |